# ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

# පුරප්පාඩු - ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

2019 මාර්තු 5 වන දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2019 ප්‍රකාරව, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ (CSRP) පහත සඳහන් තනතුරු සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP) :**

ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ණය පහසුකම් යටතේ, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම යටතේ 2026.12.31 දින දක්වා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

පහත දක්වා ඇති අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතා සපුරාලන, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය, රජයේ රෙගුලාසි පිළිබඳ අවබෝධය, විදේශ අරමුදල් ව්‍යාපෘති පරිසරයක වැඩ කිරීමේ පළපුරුද්ද හා පරිගණක සාක්ෂරතාවය සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

දුම්රිය අංශයේ (අදාල ක්ෂේත්‍රයන්හි) දැනට කටයුතු කරන අයදුම්කරුවන් මේ සඳහා අයදුම් කිරීමට දිරිගන්වනු ලැබේ.

| තනතුර | සුදුසුකම් |
|---|---|
| **ව්‍යාපෘති අධ්‍යක්ෂ**<br>**පුරප්පාඩු සංඛ්‍යාව -01 - PS-1**<br>ඉංජිනේරු, මුදල්, ප්‍රසම්පාදන, සමාජීය සහ පාරිසරික කටයුතු, මානව සම්පත්, ඉඩම් අත්පත් කර ගැනීම යනාදිය ඇතුළුව සමස්ත ව්‍යාපෘති කාර්යය සඳහා වගකීම දැරීම. ව්‍යාපෘතිය සහ අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීම. ආසියානු සංවර්ධන බැංකුවේ සහ ශ්‍රී ලංකා රජයේ මාර්ගෝපදේශ, ක්‍රියා පටිපාටි සහ රීතිවලට අනුකූලව ව්‍යාපෘති කාර්යයන් සිදු කරනු ලබන බවට සහතික වීම. | (පහත අනු අංක 01 හෝ 02 හෝ 03 අතරින් එක් සුදුසුකමක්)<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ උපාධියක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයට අයත් වෘත්තීය ආයතනයක සාමාජිකයෙකු වීම/ එවැනි ආයතනයකින් ලබා ගත් සමාන වෘත්තීය සුදුසුකමක්<br>**සහ**<br>සුදුසුකම් ලැබීමෙන් පසු, කළමනාකරණ මට්ටමින් අවම වශයෙන් අවුරුදු 16 ක පළපුරුද්දක් ලබා තිබීම හා ඉන් අවුරුදු 08 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br>02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ උපාධියක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයට අයත් වෘත්තීය ආයතනයක සාමාජිකයෙකු වීම/ එවැනි ආයතනයකින් ලබා ගත් සමාන වෘත්තීය සුදුසුකමක්<br>අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වයක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් හෝ අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්<br>**සහ**<br>සුදුසුකම් ලැබීමෙන් පසු, අදාල ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 14 ක පළපුරුද්දක් හා ඉන් අවුරුදු 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br>03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ උපාධියක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**සහ**<br>අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් තිබීම<br>**සහ**<br>අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වයක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්<br>**සහ**<br>සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් අවුරුදු 12 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් තිබීම හා ඉන් අවුරුදු 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය. |
| **02. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)**<br>**පුරප්පාඩු සංඛ්‍යාව - 1 PS-2**<br>ආසියානු සංවර්ධන බැංකු මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය, ප්‍රසම්පාදන කාලසටහන සකස් කිරීම, ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම, ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම, ප්‍රසම්පාදන කාර්යය ප්‍රශස්ථ හා කාලෝචිත අයුරින් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.<br>ප්‍රසම්පාදනය, ගිවිසුම් සකස් කිරීම, ප්‍රසම්පාදනය ආශ්‍රිත සාමාන්‍ය ගෙවීම් ආදිය සම්බන්ධයෙන් තීරණ ගැනීමට සහාය වීම සම්බන්ධයෙන් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) වගකිව යුතුය.<br>**03. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (මුදල්)**<br>**පුරප්පාඩු සංඛ්‍යාව - 1 PS-2**<br>අරමුදල් සඳහා අයවැය වෙන් කිරීම් ඇස්තමේන්තු කිරීම, ගෙවීම් යනාදී ව්‍යාපෘතියේ සියලූ මූල්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම,<br>මූල්‍ය කටයුතු සඳහා සහාය ලබා දීම,<br>ගෙවීම් ක්‍රියාවලිය සහ ආසියානු සංවර්ධන බැංකුවේ සිට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ගිණුම් වෙත මුදල් ප්‍රේෂණයවීමේ සමස්ත ක්‍රියාවලිය සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරීම,<br>මූල්‍ය ක්ෂේත්‍රයට අදාලව නිර්මාණ සැලසුම්<br>උපදේශනයන් සමඟ සම්බන්ධීකරණය. | (පහත අනු අංක 01 හෝ 02 හෝ 03 හෝ 04 අතරින් එක් සුදුසුකමක්)<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ උපාධියක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයට අයත් වෘත්තීය ආයතනයක සාමාජිකයෙකු වීම/ එවැනි ආයතනයකින් ලබා ගත් සමාන වෘත්තීය සුදුසුකමක්<br>**සහ**<br>සුදුසුකම් ලැබීමෙන් පසු, අදාල ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 15 ක පළපුරුද්දක් හා ඉන් අවුරුදු 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br>02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ උපාධියක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**සහ**<br>අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වයක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් තිබීම හා සුදුසුකම් ලැබීමෙන් පසු, කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 13 ක පළපුරුද්දක් හා ඉන් අවුරුදු 06 ක් ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටමේ විය යුතුය.<br>03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ උපාධියක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**සහ**<br>අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් තිබීම<br>**සහ**<br>අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වයක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්<br>**සහ**<br>සුදුසුකම් ලැබීමෙන් පසු, කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 11 ක පළපුරුද්දක් හා ඉන් අවුරුදු 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br>04. රජයේ දීපව්‍යාප්ත සේවාවක 1 ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ අදාල ක්ෂේත්‍රයේ ඒ හා සමාන තනතුරක් දැරීම.<br>**සහ**<br>පළමු ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 06 ක පළපුරුද්දක් තිබීම |
| **04. සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ**<br>**(සමාජ ආරක්ෂණ)**<br>**පුරප්පාඩු සංඛ්‍යාව - 1 PS-4**<br>සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති පිළියෙල කිරීම, සමාජ ආරක්ෂණ සැලසුම් නිර්මාණය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අදාළ කරුණු හා කටයුතු හඳුනා ගැනීම් හා එහි වගකීම් භාරය දැරීම. සියලුම ඉඩම් හා සමාජ ආරක්ෂණයට අදාල කටයුතු සඳහා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට සහය වීම. | (පහත අනු අංක 01 හෝ 02 අතරින් එක් සුදුසුකමක්)<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ උපාධියක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාල ක්ෂේත්‍රයට අයත් වෘත්තීය ආයතනයක සාමාජිකයෙකු වීම/ එවැනි ආයතනයකින් ලබා ගත් සමාන වෘත්තීය සුදුසුකමක්<br>**සහ**<br>සුදුසුකම් ලැබීමෙන් පසු අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද<br>02. රජයේ දීප ව්‍යාප්ත සේවාවක III/II හෝ ඉහළ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තනතුරක් දැරීම.<br>**සහ**<br>III/II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 09 ක පළපුරුද්දක් තිබීම. |

**වැටුප් පරාසය**

| | | |
|---|---|---|
| 01 | PS-01 | රු. 200,000.00 - රු. 220,000.00 (මාසික වැටුප) |
| 02 | PS-02 | රු. 185,000.00 - රු. 205,000.00 (මාසික වැටුප) |
| 03 | PS-04 | රු. 155,000.00 - රු.170,000.00 (මාසික වැටුප) |

2019 මාර්තු මස 05 වැනි දිනැති මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි නියමයන්ට අනුව ගෙවනු ලබන රජයේ අනුමත දීමනාද සහිතය.

**පොදු කොන්දේසි :**

01. වයස් සීමාව: අවුරුදු 64 ට අඩු (අවුරුදු 64 ට වැඩි අය සලකා බලනු නොලැබේ).
02. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය 08% හා සේවා යෝජකයාගෙන් 12% වන අතර සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වය මාසික වැටුපෙන් 3% කි.
03. සේවයෙහි යෙදවීම පිළිබඳ කොන්දේසි : පත්වීම් මූලික වශයෙන් වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරෙන අතර, ව්‍යාපෘතියේ කාලසීමාව සහ සතුටුදායක කාර්ය සාධනය අනුව දීර්ඝ කිරීමේ හැකියාව පවතී.

**අයදුම් කිරීම :**

සියලුම අයදුම්කරුවන්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකු ද සඳහන් කර සකස් කළ ස්වකීය ජීව දත්ත පත්‍රිකාව හා සියලුම සහතිකවල පිටපත් ද අමුණා තම අයදුම්පත් පහත දක්වා ඇති ලිපිනයට 2025.08.07 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු වේ.

අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනට රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය සේවාවල නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.

**වැඩිදුර විස්තර සඳහා : දුරකථන : 011-2187211 ෆැක්ස් : 011-2187205**

**විද්‍යුත් ලිපිනය : admin@transport.gov.lk**

**ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය (ප්‍රවාහන අංශය),**
**07 වන මහල, සෙත්සිරිපාය - අදියර 02, බත්තරමුල්ල.**
**2025.07.15**